# භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය

# පරිසර හා වනජීවී සම්පත් අමාත්‍යාංශය

# පුරප්පාඩු

## බලගැන්වීමේ නිලධාරී - JM 1-1

1992 අංක 33 දරන පතල් හා ඛනිජ ද්‍රව්‍ය පනත මගින් ස්ථාපිත කරන ලද භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශයේ පුරප්පාඩුව පවතින ඉහත තනතුර සඳහා ශ්‍රී ලංකාවේ පුරවැසියන් වෙතින් අයදුම්පත් කැඳවනු ලැබේ.

**බාහිර අයදුම්කරුවන්**
**අධ්‍යාපනික**

01. විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගනු ලබන ඕනෑම විෂය ක්ෂේත්‍රයකින් ලත් උපාධියක් හෝ විශේෂ උපාධියක්

**අභ්‍යන්තර අපේක්ෂකයින් : (පහත 1 හෝ 2)**

01. ඉහත සඳහන් පරිදි බාහිර අපේක්ෂකයන් හට අවශ්‍ය වන සුදුසුකම් ලබාගෙන තිබීම.
02. තනතුරට අදාළ බලගැන්වීමේ ක්ෂේත්‍රයේ කටයුතුවල "**කළමනාකරණ සහකාර තාක්ෂණික නොවන**" (MA 1-2) ශ්‍රේණිය - II තනතුරක අවම වශයෙන් වසර පහක (05) ක සතුටුදායක සේවා කාලයක් සාර්ථකව සම්පූර්ණ කර තිබීම.

**වැටුප් පරිමාණය :** කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක : 02/2016 පරිදි වනු ඇත.

JM 1-1 රු. 42,600 - 10 x 755 - 18 x 1,135 - 70,580 + ජීවන වියදම් දීමනාව

**වයස් සීමාව :**

වසර 22 ට නොඅඩු සහ වසර 45 ට නොවැඩි විය යුතුය. මෙම ඉහළ වයස් සීමාව අභ්‍යන්තර අපේක්ෂකයින් හට අදාළ නොවනු ඇත.

**තනතුරට අදාළ පොදු කොන්දේසි :**

- තෝරාගනු ලබන අයදුම්කරුවන්, සිය වැටුපෙන් 10% ක් සේවක අර්ථසාධක අරමුදලට දායක වනු ඇති අතර, කාර්යාංශය විසින් සේවක අර්ථසාධක අරමුදලට වැටුපෙන් 15% ක්ද, සේවා නියුක්තයින්ගේ භාර අරමුදලට අතිරේක 3% ක් වශයෙන්ද දායක වනු ඇත.
- රෝහල් වෛද්‍ය රක්ෂණ යෝජනා ක්‍රමයට හිමිකාරිත්වය ලබනු ඇත.
- බාහිර රෝගී වෛද්‍ය බිල්පත් ප්‍රතිපූරණයට හිමිකාරිත්වය ලබනු ඇත.
- රාජ්‍ය සංස්ථා / ව්‍යවස්ථාපිත මණ්ඩල වල දැනටමත් සේවය කරනු ලබන අයදුම්කරුවන් සිය අයදුම්පත් අදාළ ආයතනවල ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.
- අයදුම්කරු පිළිබඳ කරුණු කාරණා සනාථ කර තහවුරු කර ගැනීම / සත්‍යය යන් සඳහා ඥාතීන් නොවන නිර්දේශකයින් දෙදෙනෙකුගේ නම් හා ලිපින සහ දුරකථන අංක අයදුම්කරුවන් විසින් සිය අයදුම්පතේ දැක්විය යුතුය.
- අධ්‍යාපනික හා වෙනත් අදාළ සහතිකපත්වල ඡායාස්ථිත පිටපත් අයදුම්පත් සමග අමුණා ඉදිරිපත් කළ යුතුය.

අයදුම්කරනු ලබන තනතුර අයදුම්පත් බහා එවනු ලබන ලිපි කවරයේ වම්පස ඉහළ කෙළවරේ, පැහැදිලිව සටහන්කර එම අයදුම්පත් **2020.08.24** වන දිනට **හෝ ඊට** පෙර ලැබෙනසේ පහත සඳහන් ලිපිනයට ලියාපදිංචි කළ තැපෑලෙන් එවිය යුතුය. කෙටි ලැයිස්තුගත කරනු ලබන අයදුම්කරුවන් පමණක් සම්මුඛ පරීක්ෂණයන් සඳහා කැඳවනු ලැබේ.

**සභාපති,**
**භූ විද්‍යා සමීක්ෂණ හා පතල් කාර්යාංශය,**
**අංක 569, එපිටමුල්ල පාර, පිටකෝට්ටේ.**

Source: Dinamina, Daily News (2020.08.10)